**හින්දු සංස්කෘතික අරමුදල - 2015**

**------------------------------------**

හින්දු සංස්කෘතික අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, ලැබීම් හා ගෙවීම් ගිණුම, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 31 දරන හින්දු සංස්කෘතික අරමුදල් පනතේ 10(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) හි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට හින්දු සංස්කෘතික අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරන වලට අනුකූල නොවීම.**

2006 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පී.එෆ්.423 හි 4.1 (ඇ) ඡේදය ප්‍රකාරව අයවැය ලේඛණයක් අනුමත කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.1,528,732 ක වියදම් සිදුකර තිබුණි

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.786,656 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,366,697 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.580,041 ක පිරිහීමක් දක්නට ලැබුණි. ආයෝජන පොලී හා සංයුක්ත තැටි විකුණුම් ආදායම් රු.746,537 කින් අඩුවීම එයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්ය සාධනය**

හින්දු සංස්කෘතික අරමුදල් පණතේ 5වන වගන්තිය අනුව අරමුදලේ අරමුණු හා පරමාර්ථ ලෙස හින්දු පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම, හින්දු ආගම හා සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම, හින්දු ආගම සම්බන්ධ පර්යේෂණ කටයුතු, ප්‍රකාශන එළිදැක්වීම හා පරිවර්තන කටයුතු සඳහා මූල්‍ය සහ අනෙකුත් සහායයන් ලබාදීම, යනාදිය දැක්වුණි.

එසේ වුවද හින්දු සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරී සැලැස්ම අනුව හින්දු කෝවිල් සඳහා ආධාර ලබාදීම, ගවයන් නඩත්තුව සඳහා ආධාර ලබාදීම, හා හින්දු අරනෙරි ගුරුවරියන් සඳහා සාරි මිලදී ගැනීම ලෙස වැඩසටහන් 3ක් පමණක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව අරමුදල විසින් පනතේ සඳහන් අරමුණු ලඟා කර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**4.2** **කළමණාකරන අකාර්යක්ෂමතා**

සමාලෝචිත වර්ෂය තුළදී අරමුදලේ ආදායම රු.2,315,388 ක් වුවද එහි අරමුණු ඉටුකරගැනීම සඳහා වියදම්කර තිබුණේ රු.1,528,732 ක් හෙවත් සියයට 66 ක ප්‍රමාණයකි.එම වියදමින්ද සියයට 76 ක් වූ රු.1,156,344 ක මුදල හින්දු අරනෙරි ගුරුවරුන් සඳහා නිළ ඇඳුම් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,156,344 ක වියදමක් දරා තිබුණද, අදාල නිල ඇඳුම් 2015 දෙසැම්බර් 31 දින වන විටත් අරමුදල වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ආකාර්යක්ෂමතාව

----------------------------------

අරමුදලේ පාලක මණ්ඩලයේ 07 වන සභාවාරයේදී ගන්නා ලද තීරනයකට අනුව කීරමලේ නගුලේස්වරම් කෝවිලේ ගවයෙකු නඩත්තු කිරීම සඳහා රු.60,000 ක මුදලක් අදාල කෝවිල වෙත ලබා දීමට තෙලිප්පලෙයි ප්‍රාදේශීය ලේකම් වෙත සමාලෝචිත වර්ෂයේදී චෙක්පත් මඟින් ගෙවා තිබුණි. එම මුදල් අරමුදල අපේක්ෂා කළ අරමුණු ඉටුවන ආකාරයට යොදවා ඇතිද යන්න, පිළිබඳ පසු විපරම් කිරීමක් සිදු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-------------------------------------------

## 5.1 සංයුක්ත සැලැස්ම

-----------------------

අරමුදලේ දිගුකාලීන ඉලක්ක සඳහන් කරමින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

පසු ගිය වසර තුන තුලදීම කාර්යයන් ඒකාකාරීව දක්වමින් ක්‍රියාකාරී සැලැසුම් ඉදිරිපත් කර තිබූ අතර ඒවා අරමුදලේ අරමුණු සපුරා ගැනීම සඳහා කාලීන අවශ්‍යතා හඳුනා ගනිමින් භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුලත් කරමින් සකස් කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන දුර්වලතා

--------------------------------

අරමුදලෙහි පරිපාලනය සම්බන්ධව පහත ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුයි.

(අ) ප්‍රසම්පාදනය - නිළ ඇඳුම් මිලදී ගැනීමේ දී ශ්‍රී ලංකා ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීම

(ආ) සැලසුම්කරණය - අරමුදලේ අරමුණු ලඟා කරගත හැකි ආකාරයට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කිරීම